# කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර)-2014

2017 - නොවැම්බර්

**BCOME 2025 - සංවර්ධන චර්යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : හයයි (06) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. අ. සංවිධාන චර්යාව යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද ? සංවිධාන චර්යාව විෂයය වෙනත් කළමනාකරණ ක්ෂේත්‍ර සමඟ සම්බන්ධ වන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ. කණ්ඩායම් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ? කණ්ඩායම් ක්‍රියාකාරකම් පිළිබඳ සංවිධාන අවධානය යොමු කළ යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න

(ලකුණු 07)

ඇ. '' සමූහ ක්‍රියාකාරකම් පිළිබඳව සංවිධාන නැඹුරුතාවයක් පවතී'' සංවිධාන වල සමූහ සංවර්ධනය කිරීමේ අවධි පහ විස්තර කරන්න.

(ලකුණු 07

(මුළු ලකුණු 20)

02. අ. සංවිධානවල කළමනාකරුවන් සාමාන්‍යයෙන් භාවිතා කරන දේශපාලන ක්‍රමෝපායන් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

ආ. '' සියලු දෙනාට සාර්ථක ලෙස දේශපාලනය කළ නොහැක '' දේශපාලනය සාර්ථක ලෙස ඉටු කළ හැකි පුද්ගලයන්ගේ ලක්ෂණ සහ සංවිධානාත්මක දේශපාලනයේ ඵලදායීතාවයට අනුබල දෙන කොන්දේසි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඇ. බලය ඵලදායී ලෙස යොදා ගැනීම විවිධ සාධක මත රඳා පවතී. එම සාධක කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 07
(මුළු ලකුණු 20)

03. අ. සංජානනය යන පදය විස්තර කරන්න.

(ලකුණු 06)

ආ. සංජානන ක්‍රියාවලියක අන්තර්ගත වී ඇති පියවරයන් මොනවාද ? විස්තර කරන්න.

(ලකුණු 07)

ඇ. පුද්ගල හේතුකාරක දැක්වීම හා අවස්ථා හේතුකාරක දැක්වීම අතර වෙනස කුමක්ද යන්න විස්තර කරන්න.

(ලකුණු 07)
(මුළු ලකුණු 20)

04 අ. පෞද්ගලික සංවර්ධනය සහ වෘත්තීය සංවර්ධනය අතර සබඳතාවය කුමක්ද ? පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ. සෑම සේවකයකුටම එක හා සමානව උනන්දු කිරීම අපහසුය. ශිෂ්‍යයකු වශයෙන් සේවකයින් දිරිමත් කිරීම සඳහා සංවිධානයට යෝජනා කළ හැකි විවිධ ක්‍රම මොනවාද ? ඔබේ පිළිතුරට න්‍යායාත්මක පැහැදිලි කිරීම් භාවිතා කරන්න.

(ලකුණු 07)

ඇ. '' ගැටුම්කාරි තත්වයන් නමින් කිසිවක් නොමැත.'' ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද ? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

(ලකුණු 07
(මුළු ලකුණු 20)

05. අ. පංච මහා පෞර්ෂත්ව ගතිලක්ෂණ ඇසුරින් පුද්ගල චර්යාවන් පුරෝකථනය කරන්නේ කෙසේද ? විස්තර කරන්න.

(ලකුණු 06)

ආ. මනස සංවර්ධනය සඳහා අදාල වන සිග්මන් ෆ්‍රොයිඩ් ගේ දළ සිත, අහම්භවය හා සුපිරි අහම්භවය පිළිබඳ ආකෘතිය විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. සඵලදායී සන්නිවේදනයකට පවතින ප්‍රධාන බාධක කවරේද ? පණිවිඩය යවන්නා සහ පණිවිඩය ලබන්නා අතින් සිදුවිය හැකි බාධක 2 ක බැගින් විස්තර කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

06. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

අ. ප්‍රභා මණ්ඩල ඵලය

ආ. ඉගෙනීම

ඇ. මනෝරූව

ඉ. ප්‍රභේද ඵලය

ඊ. ආතතිය

(ලකුණු 4x5= මුළු ලකුණු 20)